# දරුවන් උදෙසා
# බයිබලයක්



# සභාවට පීඩා

**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා:** Ruth Klassen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**



දෙවියන් වහන්සේගේ පුත් ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී දින පනහකට පසු, ශුද්ධාත්මයාණන් වහන්සේ උන් වහන්සේගේ අනුගාමිකයන් තුළ ජීවත් වීමට පැමිණි සේක. පියාණන් වන දෙවියන් වහන්සේ, පුත්‍රයාණන් (ජේසුස්) වන දෙවියන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ යන සියල්ලෝම එකම දෙවියන් වහන්සේ වන්නේ කෙසේදැයි ගෝලයන්ට නොතේරුණත්, ඔවුන් සමඟ දෙවියන් වහන්සේ සිටීම ගැන ඔවුහු සතුටු වූවෝය. ජේසුස් වහන්සේ ගැන අනිත් අයට කියන්නට ප්‍රේරිතයන්ට උදව් කරනු පිණිස දෙවියන් වහන්සේ පුදුම දේ කළ සේක.




ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ අය දුප්පතුන්ට රැකවරණය සැලසීම සඳහා තමන් සතු සියල්ල බෙදා ගත්තෝය. නමුත් අනනියස් සහ සපිරා නම් එක් යුවළක් වංක වූවෝය. ඔවුන් යම් ඉඩමක් විකුණා ඒ ලැබුන මුදල් සියල්ලම ප්රේරිතයන්ට ගෙන දුන් බව හැඟෙව්වෝය. නමුත් රහසිගතව, ඔවුන් ඒ මුදල් වලින් කොටසක් තමන් ළඟ තබා ගත්තෝය.
3
“ශුද්ධාත්මයාණන්ට බොරු කිරීමට සාතන් ඔබේ හදවත පුරවා ඇත්තේ මන්දැ?”යි පේතෘස් අනනියස්ගෙන් ඇසුවේය. “ඔබ බොරු කීවේ මිනිසුන්ට නොව දෙවියන් වහන්සේටය” එවිට අනනියස් බිම වැටී අවසන් හුස්ම හෙළුවේය. තරුණයෝ ඔහුව ඔතා, පිටතට ගෙන ගොස් තැන්පත් කළෝය.
4
ටික වේලාවකට පසු සපිරා එහි පැමිණියේ තම සැමියා මිය ගිය බව නොදැනය. ඇයද මුදල් ගැන බොරු කීවාය. ඇයට සිදු වූයේද එයමය. මේ දේවල් ඇසූ සියල්ලෝම මහත් බියට පත් වූවෝය.
5
ශුද්ධාත්මයාණන් වන දෙවියන් වහන්සේ ප්රේරිතයන් මාර්ගයෙන් බොහෝ ලකුණු හා ආශ්චර්යයන් කළ සේක. නිදසුනක් වශයෙන්, පේතෘස්ගේ සෙවනැල්ල ඔවුන් මත පතිත වූ විට අසනීපව සිටි අය සුවපත් වූවෝය.
6
එය දෙවියන් වහන්සේගේ වැඩ සිටීම පෙන්නුම් කරන මහා හාස්කම් ඇති කාලයක් විය. වැඩි වැඩියෙන් මිනිසුන් ජේසුස් වහන්සේව විශ්වාස කළෝය. එහෙයින් නායක පූජකයා බොහෝසේ කෝපා වූයේය.
ඔහු ප්රේරිතයන්ව සිරගත කළේය!
7
නුමුත් රාත්රියේදී ස්වාමීන්වහන්සේගේ දූතයෙක් සිරගෙදර දොර ඇර ඔවුන් පිටතට ගෙනැවිත්, “යන්න, දේවමාළිගාවේ සිට, ජීවනයේ වචන සෙනඟට කියන්නැ”යි කීවේය. ප්රේරිතයෝ පිටතට ගොස් ජේසුස් වහන්සේ ගැන දේශනා කළෝය. උදයේ, උත්තම පූජකයාගේ මිනිසුන් සිරගෙදර හිස්ව තිබෙනු දුටුවේය.
8


අවසානයේදී ඔහු ඔවුන්ව සොයාගත් විට, උත්තම පූජකයා ප්‍රේරිතයන්ට බැණ වැදුණේය. “මේ නාමයෙන් ඉගැන්වීම් නොකරන ලෙසට අපි ඔබට තදින් අණ කළා නොවේද?” ඔහු ඇසුවේය. “අපි මිනිසුන්ට වඩා දෙවියන් වහන්සේට කීකරු විය යුතුයැ”යි පේතෘස් සහ අනෙකුත් ප්‍රේරිතයෝ පිළිතුරු දුන්නෝය. උත්තම පූජකයා ඉතා කෝපයට පත් වූ අතර, ඔහුට ප්‍රේරිතයන් මරා දැමීමට අවශ්‍ය විය. නමුත් ඒ වෙනුවට ඔවුන්ට පහර දී නිදහස් කරන ලෙස නියෝග කළේය. ඔවුන්ගේ වේදනාව මධ්‍යයේ වුවද, ප්‍රේරිතයෝ දෙවියන් වහන්සේට කීකරු වූ අතර ජේසුස් වහන්සේ ගැන දේශනා කළෝය.
9


එක් දිනක් ස්තේපන් නම්වූ කෙනෙකු අත්අඩංගුවට ගන්නා ලද්දේය. ස්තේපන් ස්වාමි වූ ජේසුස් වහන්සේට ප්‍රේම කළේය. ජේසුස් වහන්සේ ගැන අන් අයට පැවසීමට ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහුව භාවිතා කළ සේක.
සමහරු ස්තේපන් දෙවියන් වහන්සේට විරුද්ධව කතා කරන බවට බොරු චෝදනා කළෝය. අසාධාරණ නඩු විභාගයකින් පසු, ස්තේපන් සතුවූ ජේසුස් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය නිසා ඔහුට ගල් ගසා මරා දමන ලද්දේය.
10


ඔහු මිය යාමට පෙර, ස්තේපන්, ශුද්ධාත්මයාණන්ගෙන් පිරී, ස්වර්ගය දෙස බලා, දෙවියන් වහන්සේගේ තේජස සහ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ සිටගෙන සිටිනු දුටුවේය.
11


ස්තේපන් දෙවියන් වහන්සේට කන්නලව් කරමින්, “ස්වාමිවූ ජේසුස් වහන්ස, මාගේ ආත්මය පිළිගන්නැ”යි කියද්දී සමූහයා ගල් ගැසූවෝය. ඉන්පසුව, කුරුසියේ සිටි ජේසුස් වහන්සේ මෙන්, මෙම නිර්භීත මිනිසා තම අවසන් හුස්ම හෙළුවේ දෙවියන් වහන්සේට තම ඝාතකයන්ට සමාව දෙන ලෙස යාච්ඤා කිරීමෙන් පසුවය.
12


ස්තේපන්ගේ මරණය නව පීඩා රැල්ලක් ආරම්භ කළේය. ස්තේපන්ගේ මිනීමරුවන්ට උදව් කළ සාවුල් නම් තරුණයා ඔහුට සොයාගත හැකි සෑම කිතුණුවෙකුම අත්අඩංගුවට ගත්තේය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් තම නිවෙස්වලින් පලා ගොස් යුදයේ සහ සමාරිය පුරා විසිරී ගියෝය. ජෙරුසලමේ නැවතී සිටියේ ප්‍රේරිතයන් පමණි.
13


ඔවුන්ගේ සතුරන් ඔවුන්ව මරා දැමීමට උත්සාහ කළත්, විසිරී සිටි අය ජේසුස් වහන්සේ ගැන ශුභාරංචිය දේශනා කරමින් සෑම තැනකම ගියෝය. ජේසුස් වහන්සේගේ අනුගාමිකයින්ව කිසිවකට නතර කළ නොහැකි විය. මන්ද දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් ඔවුන් තුළ ජීවත් වෙමින් ඔවුන් හරහා ක්‍රියා කළ බැවිනි.
14

සහාවට පීඩා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ක්රියා 5-7

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130






56 60



මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත.
ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)